# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 11 දරන රංගා කලායතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 මාර්තු මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **6.00 යි.** **තැපැල් ගාස්තුව :** රු. **5.00 යි.**

**2009 අංක 11 දරන රංගා කලායතනය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 18 වන දින]

එල්.ඩී.—ඕ.-අයි.එන්.සී. 2/2007.

**රංගා කලායතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

පූර්විකාව.

"රංගා කලායතනය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක් එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එහි පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිළියන්දල, කහපොල පිහිටුවා තිබූ හෙයින් ද :

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් ද එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද ඒ ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2009 අංක 11 දරන රංගා කලායතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

රංගා කලායතනය සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) රංගා කලායතනයේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන්, (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "රංගා කලායතනය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තවද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) අපගේ සම්ප්‍රදායික සංස්කෘතික දායාදයක් වන බෙර වාදනය හා නර්තනය මතු පරපුරට දායාද කිරීමේ පරමාර්ථයෙන් විවිධ ආකාරයෙන් දායක වීම ;

(ආ) හෙළ කලා ශිල්ප ප්‍රගුණ කරන්නන් සඳහා කලා ශිල්ප පීඨයක් ලෙස රංගා කලායතනය උසස් ප්‍රමිතියෙන් යුක්තව පවත්වාගෙන යාම ;

(ඇ) ශිෂ්‍යයන්ට සම්ප්‍රදායික නර්තනය හා බෙර වාදන ශිල්පයන් හා එම රංග භාණ්ඩ නිපදවීම හා අළුත්වැඩියා කිරීම නොමිලයේ ප්‍රගුණ කිරීමේ අවස්ථාව උදා කරමින් පූර්ණ කාලීන පස් අවුරුදු පාඨමාලාවක් සැකසීම ;

(ඈ) නර්තනය සහ බෙර වාදන අංගයන් රැකගැනීම සඳහා දිරි දීම, ඊට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඉ) සංස්කෘතික උරුමයන් රැකගැනීම සහ ආරක්ෂා කිරීම ;

(ඊ) සාම්ප්‍රදායික බෙර වාදනය හා නර්තනයේ නව ප්‍රවණතාවයන් මගින් මෙම සම්ප්‍රදායික කලාව යෞවනයන් අතර ආකර්ශනීය බවට පත් කරවීම ;

(උ) යෞවන සහභාගීත්වයෙන් සම්ප්‍රදායික කලා පද්ධතිය ආරක්ෂා කිරීමේ ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් ආරම්භ කිරීම ;

(ඌ) රට තුළ සහ ඉන් පිටත ක්‍රියාත්මකවන ආගමික, සංස්කෘතික හා සමාජයීය කටයුතුවලට හැකි උපරිමයෙන් සක්‍රීයව දායක වීම ;

(එ) ශිෂ්‍යයන්ට විවිධ සංස්කෘතික වැඩසටහන්වලට සහභාගිවීමට අවස්ථාව ලබා දීම ;

(ඒ) ශිෂ්‍යයන්ට පාඨමාලාව අවසානයේ දී සාර්ථක ව්‍යවසායකයන් වීමට අවශ්‍ය මූල්‍යමය ශක්තිය ලබාදීම ;

(ඔ) සාම්ප්‍රදායික කලාකරුවන්ගේ හා විශ්‍රාමික කලාකරුවන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම හා ආරක්ෂාව සඳහා විශේෂ සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම ; සහ

(ඕ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය යයි සංස්ථාව විසින් සලකනු ලබන පොත්, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ වාර සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදාහැරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු ආයතනාධිපති, නියෝජ්‍ය ආයතනාධිපති, සහකාර ආයතනාධිපති, ලේකම්, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරාපත් කරනු ලබන තවත් සිව්දෙනකුගෙන් යුත් සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ පාලක සභාවක් (මින් මතු “සභාව” යනුවෙන් හඳුවන් ලබන) විසින්, මේ පනතේ 7 වන වගන්තිය යටතේ දැක්වෙන අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව, කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, පැවති ආයතනයේ පාලක සභාවේ ධුර දරමින් සිටි සාමාජිකයන්ගෙන් සංස්ථාවේ පළමුවන කළමනාකරණ මණ්ඩලය සමන්විත විය යුතු ය.

උපදේශක මණ්ඩලය.

**5.** ආයතනය උපදේශක මණ්ඩලයකින් ද සමන්විත වන අතර, එහි සාමාජිකයන් පස්දෙනා සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. උපදේශක මණ්ඩලයට සභාවේ රැස්වීම්වලට සහභාගි විය හැකි නමුත් ඡන්දය පාවිච්චි කිරීමට බලය නොමැත.

දේපළ අත්කර ගැනීම, අරමුදල් ආයෝජනය කිරීම සහ ණය ගැනීම යනාදිය පිළිබඳව සංස්ථාවේ බලතල.

**6.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිළයට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදි කිරීමට හෝ අන්‍යාකාරයෙන් ලබාගැනීමට ;

(ආ) සංස්ථාවේ කාර්යය සඳහා රජයේ හෝ අනුමත බැංකු හා ආයතනවලින් මුදල් ණයට ගැනීමට හෝ ලබාගැනීමට හෝ ආධාර සහ පරිත්‍යාග (දේශීය හෝ විදේශීය) වශයෙන් සභාවේ අනුමැතිය පරිදි ලබාගැනීමට ;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාරගැනීමට, වට්ටම් දීමට, ගනුදෙනු කිරීමට, මිලයට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට හා වැසීමට ;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදලක් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඉ) දායක මුදල්, සම්මාදම්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ සියලු වර්ගවල ත්‍යාග ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට ;

(ඊ) යම් තැනැත්තකු, යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට ;

(උ) යම් ස්ථාවර දේපළකට හෝ පෞද්ගලික දේපළකට බලපාන කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට ;

(ඌ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීමට ;

(එ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි සේවක පිරිස් පුහුණු කිරීමට,

සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සභාව තෝරා පත්කර ගැනීම, ඔවුන් ධුර අත්හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ සභාවේ බලතල, කාර්ය සහ චර්යාව ;

(ආ) සංස්ථාවේ විවිධ ආචාර්යවරුන්, නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ ඔවුන්ගේ සේවය අවසන් කිරීම සහ වැටුප් ගෙවීම ;

(ඇ) සභාවේ, සංස්ථාවේ හෝ යම් අනු කමිටුවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම කැඳවීම සහ පැවැත්වීම, එම රැස්වීම්වල දී පුරප්පාඩු පිරවීම, දැන්වීම් සහ න්‍යාය පත්‍ර, රැස්වීම් පිළිබඳ ගණපූරණය සහ එහි දී කටයුතු කරගෙන යාම ;

(ඈ) සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම් ;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති ආයතනයේ රීති, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම. වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, එහි මුදල් වර්ෂය, සෑම වර්ෂයකම ජනවාරි මස 1 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා විය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාව වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන, සංස්ථාවේ සභාව විසින් අනුමත කරනු ලබන බැංකුවක සංස්ථාවේ නමින් තැන්පත් කළ යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, මණ්ඩලය විසින් පත්කරන ලද සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සෑම වර්ෂයකම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**9.** සංස්ථාවේ ආයතනාධිපති හා ලේකම්වරයා හෝ සංස්ථාව විසින් යථාපරිදි බලය දෙනු ලැබූ සභාවේ වෙනත් යම් තැනැත්තකු, ඉදිරිපිට හැර සංස්ථාවේ මුද්‍රාව කවර වූ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.